SRI LANKA EXPORT DEVELOPMENT BOARD

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය

இலங்கை ஏற்றுமதி அபிவிருத்திச் சபை

කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය

ලංසු සඳහා ආරාධනයයි

තැගී භාණ්ඩ හා ජීවන රටා සහ හස්ත කර්මාන්ත (Giftware & Lifestyle and Handicrafts) ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කර්මාන්තය (Creative Industy) පිළිබඳ ප්‍රවර්ධන වීඩියෝවක් (Professional Video) නිෂ්පාදනය කිරීම සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදනය-ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)

1. කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB), ශ්‍රී ලාංකේය නිර්මාණාත්මක කර්මාන්තයේ ශක්තීන්, හැකියාවන් සහ විභවයන් ඵලදායී ලෙස ප්‍රදර්ශනය කරන උසස් තත්ත්වයේ, වෘත්තීය ශ්‍රව්‍ය-දෘශ්‍ය (AV) ඉදිරිපත් කිරීමක් නිෂ්පාදනය කිරීමට යෝජනා කර ඇත.

2. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (SLEDB) වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ (DPC) සභාපති විසින්, ශ්‍රී ලංකාවේ තැගී භාණ්ඩ, ජීවන රටා සහ හස්ත කර්මාන්ත (Giftware & Lifestyle and Handicrafts) ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමුකරමින් ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කර්මාන්තය පිළිබඳ ප්‍රවර්ධන වීඩියෝවක් නිෂ්පාදනය කිරීම සඳහා සුදුසු සේවා සපයන්නෙකු තෝරා ගැනීම වෙනුවෙන් යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන්ගෙන් මුදු, තබන ලද ලංසු කැඳවනු ලැබේ.

3. ලංසු තැබීම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ (GOSL) ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල දක්වා ඇති පරිදි ජාතික තරඟකාරී ලංසු තැබීමේ (NCB) ක්‍රියාපටිපාටිය භාවිතයෙන් සිදු කෙරෙන අතර, ප්‍රසම්පාදන ලේඛනයේ දක්වා ඇති සුදුසුකම් සපුරාලන සියලුම සුදුසුකම් ලත් ලංසුකරුවන් සඳහා එය විවෘත වේ.

4. උනන්දුවක් දක්වන සුදුසුකම් ලත් ලංසුකරුවන්ට සහකාර අධ්‍යක්ෂ/ප්‍රසම්පාදන ඒකකය, 06 වන මහල, NDB – EDB කුළුණ, අංක 42, නවම් මාවත, කොළඹ 02, දුරකථන: 011-2300702, විද්‍යුත් තැපෑල: disna@edb.gov.lk වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැකිය.

5. ප්‍රසම්පාදන ලේඛනය ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ (SLEDB) නිල වෙබ් අඩවියවන (https://www.srilankabusiness.com/anouncements) වෙතින් "Announcements Section" යටතේ බාගත කර ගත හැකිය. සුදුසුකම් ලත් ලංසුවක් ලෙස සැලකීම සඳහා, රුපියල් 1,000.00 ක ආපසු නොගෙවන ගාස්තුවක් ලංසු ලියවිල්ලේ සඳහන් බැංකු ගිණුම් විස්තර වෙත ගෙවිය යුතු අතර, ගෙවීම් පත්‍රිකාවේ හෝ ලදුපතේ පිටපතක් යෝජනාවට අමුණා තිබිය යුතුය. මෙම ගෙවීම් පත්‍රිකාව හෝ ලදුපත නොමැතිව ඉදිරිපත් කරන ලද යෝජනා ඇගයීම සඳහා සලකා බලනු නොලැබේ.

6. ලංසු මුල් පිටපත කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ - EDB/PU/NCB/2026/06 **"තැගි භාණ්ඩ හා ජීවන රටා සහ හස්ත කර්මාන්ත (Giftware & Lifestyle and Handicrafts) ක්ෂේත්‍ර කෙරෙහි අවධානය යොමු කරමින් ශ්‍රී ලංකාවේ නිර්මාණාත්මක කර්මාන්තය පිළිබඳ ප්‍රවර්ධන වීඩියෝවක් නිෂ්පාදනය කිරීම සඳහා සේවා සපයන්නෙකු තෝරා ගැනීමේ ප්‍රසම්පාදනය-ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය (EDB)"** සඳහා ලංසු ලෙස සලකුණු කළ යුතුය. ලංසුව ඉදිරිපත් කරන ආයතනයේ සහ පුද්ගලයාගේ නම කවරය මත සඳහන් විය යුතුය. මුදු, තබන ලද ලංසු, නියමිත ගෙවීම සිදු කර 2026 නොවැම්බර් 19 වන දින පස්වරු 02.00 ට පෙර ලැබෙන සේ ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ ප්‍රසම්පාදන ඒකකයේ (6 වන මහල) ඇති ටෙන්ඩර් පෙට්ටියට දමිය යුතුය නැතහොත් ලියාපදිංචි තැපෑලෙන් 'සභාපති- දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, ප්‍රසම්පාදන ඒකකය, 6 වන මහල, ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය, අංක 42, නවම් මාවත, කොළඹ 02' යන ලිපිනයට, එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. සියලුම ලංසු සමඟ ප්‍රසම්පාදන ලේඛනයේ දක්වා ඇති ආකෘතිය භාවිත කරමින් රුපියල් පනස් දහසක (LKR 50,000.00) බැංකු ඇපකරයක් ආකාරයෙන් ලංසු සුරක්ෂණයක් අනිවාර්යයෙන්ම ඉදිරිපත් කළ යුතුය.

7. මුදු, තැබූ තාක්ෂණික යෝජනාව (Technical Proposal) එහි පිටපතක් සමඟ සහ මූල්‍ය යෝජනාවේ (Financial Proposal) පිටපතක් වෙන වෙනම ඉදිරිපත් කරන ලෙස ලංසුකරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ. තාක්ෂණික සහ මූල්‍ය යෝජනා අඩංගු කවර තවත් පිටත කවරයකට බහා මුදු, තැබිය යුතුය. මෙම මාර්ගෝපදේශ පිළිපැදීමට අපොහොසත් වන ලංසුකරුවන් වැඩිදුර ඇගයීම සඳහා සලකා බලනු නොලැබේ.

8. ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනයේ සිට දින 77 ක කාලයක් සඳහා ලංසු වලංගු විය යුතුය.

9. තාක්ෂණික යෝජනා (Technical Proposal) භාර ගැනීම 2026 නොවැම්බර් 19 වන දින පස්වරු 2.00 ට අවසන් කරනු ලබන අතර එදිනම පස්වරු 2.15 ට, ඉහත (4) ඡේදයේ දක්වා ඇති ලිපිනයේ පිහිටි SLEDB කාර්යාලයට පෞද්ගලිකව පැමිණ සිටීමට කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ගේ සහභාගීත්වයෙන් විවෘත කරනු ලැබේ. ලංසුකරුවෙකු වෙනුවෙන් පෙනී සිටින ඕනෑම නියෝජිතයෙකු, තාක්ෂණික යෝජනා විවෘත කිරීමේදී ලංසුකරු නියෝජිතය කිරීම සඳහා අදාළ ලංසුකරු/සමාගම විසින් නිසි ලෙස අත්සන් කරන ලද බලය පැවරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතුය.

10. ලංසු සකස් කිරීම හෝ භාර දීම සම්බන්ධයෙන් ලංසුකරුවන් දරන කිසිදු පිරිවැයක් හෝ වියදමක් සඳහා SLEDB වගකියනු නොලැබේ.

සභාපති / ප්‍රධාන විධායක නිලධාරී,
ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
NDB - EDB **කුළුණ, අංක 42, නවම් මාවත, කොළඹ 02.**
වෙබ් අඩවිය : http://www.srilankabusiness.com